# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සමස්ත ලංකා භික්ෂු සහයෝගිතා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ)

**සමස්ත ලංකා භික්ෂු සහයෝගිතා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මයන්ත දිසානායක මහතා විසින් 2015 දෙසැම්බර් මස 15 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 නොවැම්බර් මස 23 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[54 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 11.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

## සමස්ත ලංකා භික්ෂු සහයෝගිතා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ)

### සමස්ත ලංකා භික්ෂු සහයෝගිතා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

''සමස්ත ලංකා භික්ෂු සහයෝගිතා සංවර්ධන පදනම'' යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන කාර්යායතනයක් එකී සාමාජිකයන් විසින් එකඟ වන ලද රීතිවලට අනුකූලව ඒ අදාළ සියලු පරමාර්ථ හා කරුණු සාර්ථක ලෙස ඉටු කරගෙන යාමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක කරන හෙයින් ද :

එකී කාර්යායතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් ඒ කාර්යායතනය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර හා ඉටුකර ඇති හෙයින් සහ එකී කාර්යායතනය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින්ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2015 අංක දරන සමස්ත ලංකා භික්ෂු සහයෝගිතා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

සමස්ත ලංකා භික්ෂු සහයෝගිතා සංවර්ධන පදනම සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු ''කාර්යායතනය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''සමස්ත ලංකා භික්ෂු සහයෝගිතා සංවර්ධන පදනමේ'' දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් හෝ සමස්ත ලංකා භික්ෂු සහයෝගිතා සංවර්ධන පදනමට මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු ''සංස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''සමස්ත ලංකා භික්ෂු සහයෝගිතා සංවර්ධන පදනම'' යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි වන්නේ ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එම මුද්‍රාව වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය එම සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(1) මෙම පදනමේ දර්ශනය, පොදු අරමුණු, පොදු ප්‍රතිපත්ති සහ සංවර්ධන වැඩසටහන් ශ්‍රී ලංකාව තුළ ජීවත්වන ජනතාවට අවබෝධ කර දීම, ස්වශක්තිය හා සාමූහිකත්වය ගොඩනැංවීමට භික්ෂූන්ගේ හා ජනතා සහභාගීත්වයෙන් ඒවා ක්‍රියාත්මක කිරීම:—

(i) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන විවිධ ආයතන, සමාගම්වලට අවශ්‍ය වන මග පෙන්වීම හා සමායෝජනය ලබා දීම ;

(ii) පහත දැක්වෙන මූලික මානුෂික අවශ්‍යතා සපුරාලීමෙහිලා ප්‍රතිපත්ති සහ සැලසුම් සෑදීම, ඒවා ක්‍රියාත්මක කිරීම සහ ප්‍රතිඵල ඇගයීම සම්බන්ධයෙන් අවශ්‍ය නායකත්වය සැලසීම:—

(අ) පරිසරය ;
(ආ) ජලය ;
(ඇ) නිවාස ;
(ඈ) සෞඛ්‍යය ;
(ඉ) අධ්‍යාපනය ;
(ඊ) සංස්කෘතික සහ ආධ්‍යාත්මික වැඩසටහන්.

(iii) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ආයතන සමග සම්බන්ධතා පවත්වන ආයතනය වශයෙන් ක්‍රියා කිරීම.

(2)(i) බුදුරජාණන් වහන්සේගේ ධර්ම-විනය මැනවින් තේරුම්ගෙන ඒ අනුව යමින් සසුන් කෙත බැබලවීමට ක්‍රියා කිරීම;

(ii) සමස්ත භික්ෂූන් වහන්සේලාගේ විනය හා සංඝ සභාවල ව්‍යවස්ථා හා කතිකාවත් එලෙසින් ම පිළිගෙන ඒවා ක්‍රියාත්මක කිරීම ;

(iii) සංඝ සභාවල පැවිදි සාමාජිකයන්ගේ සියලුම වෙහෙර, විහාරස්ථාන හා ගොදුරු ගම් ඉලක්ක කර ගනිමින් අවස්ථාවෝචිත ව්‍යාපෘති සැලසුම් ක්‍රියාත්මක කිරීම ;

(iv) ගුරු ශිෂ්‍ය සම්බන්ධතාව තහවුරු වන ආකාරයටත් අන්‍යයන් සමග සුහදතාව වර්ධනය වන ආකාරයටත් සතුටුසාමීචි පැවැත්වීම හා සුදුසු යෝජනා ක්‍රියාත්මක කිරීම ;

(v) විහාරස්ථානයක කුමන ආකාරයක හෝ අර්බුදකාරී අවස්ථාවක් පැනනැගුන විට එම අර්බුදකාරී අවස්ථාව පිළිබඳ මැනවින් විමසා බලා කාලෝචිත පියවරක් ගැනීම සඳහා මැදිහත් වීම;

(vi) සෑම අවස්ථාවක දී ම සග මහලු පිළිවෙලට අනුව සියලුම ආගමික, සාමාජික කටයුතුවල දී හැසිරීම හා පදවිප්‍රාප්ත වයෝවෘද්ධ වැඩිහිටි භික්ෂූන් වහන්සේලාගේ මග පෙන්වීම හා අවවාද අනුශාසනා මෙන්ම සම්ප්‍රදායයන් පිළිගෙන අනුගමනය කිරීම;

(vii) කාලීන අවශ්‍යතා පරිදි ධර්ම විනය සම්බන්ධයෙන් දැනුවත් කිරීම, භාෂා සාහිත්‍යය හා ලේඛන කලාව පිළිබඳ පුහුණුවක් ලබා දීමට උනන්දු කිරීම හා ඒ සම්බන්ධ කුසලතා වර්ධනය කිරීමට ක්‍රියා කිරීම;

(viii) ශ්‍රී ලංකාව තුළ තිබෙන සියලු විහාරස්ථාන සම්බන්ධ කොට දායක දායිකාවන් එක්රැස් කොට සමිති සමාගම් පිහිටුවා ස්ථාපිත කිරීම, ඒ තුළින්, ගුණ ධර්ම වැඩිදියුණු කර ගනිමින් පැරණි සිරිත් විරිත් අගයන සමගි සම්පන්න සමාජයක් ගොඩනැගීම;

(ix) අධ්‍යාපනික සංවර්ධන පුහුණු වැඩසටහන් ඇති කිරීම ;

(x) පරිසරය සංරක්ෂණය කිරීම හා ආරක්ෂා කිරීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(xi) මනා ගිහි පැවිදි සම්බන්ධතාවක් ගොඩනැගීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

(xii) චාම් දිවි පැවැත්මක අරමුණු ක්‍රමයෙන් ඉටුකර ගැනීම;

(xiii) පදනමේ අරමුණු ඉෂ්ට කරගැනීම සඳහා උපයෝගී කර ගන්නා මාර්ග යහපත් හා පිරිසිදු ඒවා විය යුතු බව පිළිගැනීම;

(xiv) සමාජයික, සදාචාරාත්මක, දේශපාලනමය හා ආර්ථික වශයෙන් සම්පූර්ණ අහිංසාවාදී විප්ලවයක් ගමේත්, නගරයේත් ඇති කිරීමෙහිලා පදනම විසින් ගත් පළමු පියවර ශ්‍රමදාන බව අවබෝධ කරගෙන යුක්තිය සහ

සමානාත්මතාව ප්‍රධාන ලක්ෂණය කොට කවර අන්දමේ හෝ පෙළීම්වලින් තොර සමාජ ක්‍රමයක් බිහිකිරීම සඳහා කාලෝචිතව ගන්නා සෙසු පියවර සහ ක්‍රියාමාර්ග ගැන සැලකිලිමත්ව සේවය කිරීම;

(xv) ශාසනයේ ඉදිරි පැවැත්ම සඳහා අතිශයින්ම ප්‍රයෝජනවත් වන සාමණේර භික්ෂු පිරිස හා උපසම්පන්න තරුණ භික්ෂු පිරිස උතුම් ශාසනික සම්පතක් ලෙස අගය කිරීම, රැකගැනීම හා අවශ්‍ය විධිමත් දැනුවත් කිරීම් හා උපදේශනයන් ලබාදීම ;

(xvi) කිසියම් විහාරස්ථානයක භික්ෂුන්වහන්සේ කෙනකු අපවත් වූ විටෙක වගකීමෙන් කටයුතු කිරීම හා එම කටයුතු අවසන් වන තුරුම කැපවීමෙන් යුතුව ක්‍රියාකිරීම;

(xvii) ඉල්ලීමක් ලද අවස්ථාවක ශාසනික උත්සව අවස්ථාවලදී උපරිම දායකත්වයක් ලබාදීම, විහාරස්ථානවල සංවර්ධන කටයුතු සඳහා හෝ ආගමික උත්සව හෝ උපහාර උත්සව හෝ දහම් පාසල් උත්සව අවස්ථාවල දී සෑම සාමාජිකයෙක්ම කැපවීමෙන් හා වගකීමෙන් කටයුතු කිරීම;

(xviii) කාලීන වශයෙන් වැදගත් වන පහත සඳහන් සංස්කෘතික, ආර්ථික, සමාජයීය බහුජන ව්‍යාපෘති යෝජනා කිරීම හා ක්‍රියාත්මක කිරීම:—

(1) ග්‍රාමීය මාර්ග දියුණු කිරීම;
(2) සෞඛ්‍ය පහසුකම් ඉහළ නැංවීම;
(3) නිවාස පහසුකම් ඉහළ නැංවීම;
(4) පරිසර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;
(5) පිරිවෙන්වල ඉගෙනුම ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට අධ්‍යාපන උපකරණ හා භාෂා හැකියාව ලබාදීමට උත්සාහ කිරීම;
(6) වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;
(7) සුභසාධන වැඩකටයුතු ඉහළ නැංවීම;
(8) සංස්කෘතික හා ආර්ථික අවශ්‍යතා සංවර්ධනය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

**4.** නිලධාරී මණ්ඩලය —

පදනමේ නිලධාරී මණ්ඩලය හා ඔවුන්ගේ බලතල.

1. සභාපති , උපසභාපති
2. ලේකම්, නියෝජ්‍ය ලේකම්, සහකාර ලේකම්

3. භාණ්ඩාගාරික
4. ගිණුම් පරීක්ෂක
5. කාරක සභාව
6. විද්වත් මණ්ඩලය
7. අනුකම්පිත සාමාජිකත්වය

1. සභාපති —

(1) සෑම අවස්ථාවකම මුලසුන දැරීම;

(2) සභාවේ වැඩ කටයුතු මෙහෙයවීම හා න්‍යාය පත්‍ර ආදිය සකස් කිරීම;

(3) මෙම පදනම වෙනුවෙන් කැපවී දැඩි ආත්ම ශක්තියෙන් යුක්තව ප්‍රබල නායකත්වයක් ලබාදීම සඳහා ක්‍රියාකිරීම;

(4) සභා සම්මුතිය අනුව සභාපතිවරයා අවසාන තීරකයා බවට පත්වීමේ වගකීම, බැංකු ගිණුම් හා මුදල් ආපසු ලබා ගැනීමේ දී අත්සන් තැබීම.

2. උපසභාපති —

සභාපති නැති සෑම අවස්ථාවක දී ම සභාපතිවරයා සතු සියලු වගකීම් දැරීම හා අදාළ කාර්යභාරය නිසි ලෙස ඉටු කිරීම සහ ඊට අමතරව සභාපතිවරයාගේ සහායකයා ලෙස කටයුතු කිරීම.

3. ලේකම් —

සෑම සභා වාරයකම නිවැරදි වාර්තා තැබීම, සභාවට ඉදිරිපත් කිරීම, වාර්ෂික වාර්තා සකස් කිරීම, නියමිත දිනයට රැස්වීම් කැඳවීම, සමිතිය සතු සියලුම ලියකියවිලි විධිමත් පරිදි ගොනු කිරීම, අදාළ ලිපි ලේඛනවලට පිළිතුරු සැපයීම, අත්සන් තැබීම, පදනමේ කටයුතු සඳහා නිල මුද්‍රාව භාවිතය හා වෙනත් පවරනු ලබන කාර්යයන් නිසි පරිදි ඉටුකිරීම සඳහා බැඳී සිටින්නේය. බැංකු සඳහා හා මුදල් ආපසු ලබා ගැනීමේ දී අත්සන් තැබීම, අවශ්‍යතා පරිදි කාරක සභා රැස්වීම් පැවැත්වීම හා එම තොරතුරු මහා සභාවට දැන්වීම.

4. නියෝජ්‍ය ලේකම් —

ලේකම්වරයා නොමැති අවස්ථාවල ඉහත ලේකම් තනතුරේ සියලු කටයුතු ආවරණය කිරීම හා එම ධුරයේ සියලු වගකීම් දැරීම.

5. සහකාර ලේකම් —

පදනම මගින් සම්මත කර ගන්නා ශාස්ත්‍රීය කටයුතු, පොත්පත්, ලිපි ලේඛන, පත්‍රිකා, දැන්වීම්, ප්‍රචාරක හා මාධ්‍ය කටයුතු භාරව ක්‍රියා කරනු ලබන අතර, විද්වත් මණ්ඩලයේ උපදෙස් පරිදි කටයුතු කිරීම සහ දැනුවත් කිරීමේ වැඩමුළු, උපදේශන සාකච්ඡා, ධර්ම දාන කටයුතු මෙහෙයවීම.

6. භාණ්ඩාගාරික —

පදනම සතු සියලුම මූල්‍ය කටයුතු භාරව ක්‍රියා කිරීම, සාමාජික මුදල් හා අනෙකුත් පරිත්‍යාග නිසි පරිදි ගිණුම්ගත කිරීම, වාර්තා තැබීම, මුදල් බැංකුගත කිරීම, බැංකුවෙන් මුදල් ලබා ගැනීමේ අත්සන් තැබීම, වාර්ෂික ආදායම් වියදම් ගිණුම් සකස් කිරීම, පදනම මගින් යෝජනා කරනු ලබන පරිදි මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම, පදනම සතු නිශ්චල, චංචල දේපළ සංරක්ෂණය කිරීම.

7. කාරක සභාව —

මහා සභාවකදී තෝරා පත්කර ගනු ලැබූ කාරක සභිකයන් නවදෙනකුගෙන් යුක්ත වන අතර, සෑම සභා වාරයකටම පැමිණීම හා රැස්වීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම කළ යුතුවේ. කාරක සභා රැස්වීම් සඳහා සහභාගීවීම හා තම බල ප්‍රදේශයේ තොරතුරු හා කාරක සභා තොරතුරු අනෙකුත් සාමාජිකයන්ට දැන්වීමේ සන්නිවේදන කටයුතු කිරීම, සෑම අවස්ථාවකදීම සාමාජිකයන් හා නිලධාරී මණ්ඩලය අතර අන්‍යොන්‍ය සම්බන්ධතාව වර්ධනය කිරීම හා සම්බන්ධතාව තහවුරු වන පරිදි කටයුතු කිරීම, සභාව විසින් පවරනු ලබන කටයුතු ඉටුකර දීමට අනලස්ව ක්‍රියා කිරීම.

8. විද්වත් මණ්ඩලය —

විද්වත් මණ්ඩලය මහා සභාවකදී තෝරාපත් කර ගත යුතු ය. මේ සඳහා ධර්මධර, විනයධර, අත්දැකීම් බහුල, වයෝවෘද්ධ, බහුශ්‍රැත, රාජකීය පණ්ඩිත, උපාධිධර, ප්‍රාචීනාචාර්ය, හා විශේෂ කුසලතා ඇති භික්ෂූන් වහන්සේලා මහා සභාවේ අභිමතය පරිදි පත්කර ගැනීම කළ හැකි ය. විද්වත් මණ්ඩලයේ සියලුම සාමාජිකයන් මෙම පදනමේ හිමිකරුවන් හැටියට සළකනු ලබන අතර, විද්වත් මණ්ඩලය සෑම අවස්ථාවක දී ම සභාවේ හා එහි සාමාජිකයන්ගේ අභිවෘද්ධිය සඳහා ම

ක්‍රියා කරන්නේ ය. ධර්ම, විනය, සම්බන්ධ කරුණු හා සියලුම සාමාජිකයන් යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය සෑම අවස්ථාවකදීම සුදුසු පරිදි ක්‍රියාත්මක කිරීම ද විද්වත් මණ්ඩලය සතු වන්නේ ය.

සාමාජිකත්වය

**5**. (i) නිකාය භේදයෙන් තොරව ශ්‍රී ලංකාව තුළ වැඩ වාසය කරන භික්ෂූන් වහන්සේලාට හා ශාසන ජෝතිකා කාරක සංඝ සභාවේ විහාරාධිපතීන් වහන්සේලාට, ආචාර්ය උපාධ්‍යායයන් වහන්සේලාට, සද්ධිවිහාරිකයන් වහන්සේලාට, උපසම්පන්න හා සාමණේර භික්ෂූන් වහන්සේලාට මෙහි සාමාජිකත්වය හිමිවේ. ඒ සඳහා වන ඉල්ලුම් පත්‍රය සකස් කර සාමාජිකත්වය ලියාපදිංචි කර ගැනීම කළයුතු වන්නේ ය.

(ii) මෙම සභාවේ වර්ධනය සඳහා වූ වත්කම් භාරයට සෑම විහාරස්ථානයකින් ම බරපැනක් දැරිය යුතු අතර, එය සභා සම්මත කරගත් පරිදි මසකට රුපියල් සියය බැගින් වසරකට රුපියල් එක්දහස් දෙසීයක් වේ. එය එක්වර හෝ වාරික වශයෙන් භාණ්ඩාගාරික වෙත ලබාදිය යුතු අතර, ඒ සඳහා වූ අදාළ ලදුපත් ද නිකුත් කරනු ලැබිය යුතු ය.

(iii) සෑම සාමාජිකයෙක්ම මෙත් සිත් පෙරටුව ධර්ම, විනයානුකූලව දිවි ගෙවන තාක් සම්ප්‍රදායානුකූලව ව්‍යවස්ථා හා කතිකාවත් පිළිපදින පිරිසක් වන අතර, මෙම සභාවේ සියලු සාමාජිකයන් වටිනාම පුද්ගල සම්පත් ලෙසද සළකනු ලබයි. සියලුම සාමාජිකයන් ක්‍රියාකාරී සාමාජිකයන් ලෙස සමගි සම්පන්න සහජීවනයෙන් ක්‍රියාකිරීම අවශ්‍ය වේ. එමෙන්ම සියලු සාමාජිකයන් සෑම සභාවකටම සහභාගී විය යුතු ය.

සංස්ථාවේ බලතල.

**6**. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව පහත දැක්වෙන දෑ කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන යම් නිශ්චල දේපලක් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම, හුවමාරු කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් නියාදනය කිරීම, බැඳීමකට යටත් කිරීම හෝ බැහැර කිරීම;

(ආ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීම සඳහා හෝ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්තුවලට කෙලින්ම හෝ සංස්ථාව විසින් බලය පවරනු ලැබූ සංස්ථාවේ යම් නිලධරයකු හෝ නියෝජිතයකු මාර්ගයෙන් ඇතුළත් වීම, ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම ;

(ඇ) මුදලින් හෝ ද්‍රව්‍යවලින් ත්‍යාග, පරිත්‍යාග හෝ රික්තවරණ භාර ගැනීම ;

(ඈ) ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම, භාර ඇති කිරීම සහ පරිපාලනය කිරීම සහ යම් බැංකුවක ජංගම තැන්පතු සහ ඉතිරි කිරීමේ ගිණුම් පවත්වාගෙන යාම ;

(ඉ) පොත්, වාර ප්‍රකාශන, සඟරා සහ වෙනත් ලිපිලේඛන ප්‍රසිද්ධ කිරීම හෝ ප්‍රසිද්ධ කිරීමට කටයුතු යෙදීම සහ පුස්තකාල, පොත් සාප්පු සහ මුද්‍රණාල පිහිටුවීම සහ පවත්වාගෙන යාම ;

(ඊ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන මුදල් සුදුසු යයි සංස්ථාව විසින් සඳහන් කරනු ලබන ආකාරයට සහ එසේ සුදුසු යයි සලකනු ලබන ඇප මත මුදල් අත්තිකාරම් දීම හෝ ණයට දීම හෝ ණයට ගැනීම ;

(උ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි යෙදවීම, මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය පවත්වා ගෙන යාම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි නියම කිරීම ; සහ

(ඌ) සාමාන්‍යයෙන් සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සහ ආනුෂංගික හෝ හිතකර වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

සංස්ථාවේ රීති.

**7.** (1) පහත දැක්වෙන සියලු ම කරුණු හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් නෙරපීම හෝ ඉල්ලා අස්වීම ;

(ආ) සංස්ථාවේ නිලධරයන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් ධුරය හිස් කිරීම හෝ ඔවුන් ධුරයෙන් නෙරපීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඇ) කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් තෝරාපත් කරගැනීම සහ කළමනාකරණ මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය සහ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම, පැවැත්වීම සහ ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම් පවත්වන දිනය, ස්ථානය, රැස්වීම් පිළිබඳ දැන්වීම්, න්‍යාය පත්‍ර හා රැස්වීම්වල ගණපූරණය හා රැස්වීම්වලදී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම හා ඒවා විගණනය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම;

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන් ම සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සාමාජික ලේඛනය.

**8.** සංස්ථාවේ කළමනාකරණ මණ්ඩලය විසින්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයේ දී සංස්ථාවේ සාමාජිකයකුව සිටින සෑම තැනැත්තකුගේ ම සහ ඉන් පසුව සංස්ථාවේ සාමාජිකයකු ලෙස යථා පරිදි ඇතුළත් කර ගන්නා සෑම තැනැත්තකුගේ ම නම, ලිපිනය, සහ සංස්ථාවේ තත්කාලීනව බලපවත්නා රීති යටතේ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරුද සටහන් කර තබනු ලැබිය යුතු ලේඛනයක් පවත්වා ගැනීමට සැලැස්විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**9.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු, නීයාදන, පැවරුම්, පරිත්‍යාග, සම්මාදම් මුදල් හෝ ගාස්තු වශයෙන් ලැබෙන සියලු මුදල් කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක, සංස්ථාවේ නමින් තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ දේපල පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම, හෝ වැඩිදියුණු කිරීම සඳහා යම් අගය ක්ෂයවීමේ අරමුදලක්, සංචිතයක් හෝ නිදන් අරමුදලක් සංස්ථාව විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ බලතල සහ කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාව විසින් දරනු ලැබූ සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**10.** සභාපතිවරයා ද ලේකම් හෝ භාණ්ඩාගාරික යන දෙදෙනාගෙන් එක් අයකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

විගණනය හා ගිණුම්.

**11.** (අ) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(ආ) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබාගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(ඇ) සංස්ථාවේ ගිණුම් සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවනු ලැබූ වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වූ ද ගණකාධිකාරීවරයකු

වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නාවූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගෙන් හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**13.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.